ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

නීතිවේදී උපාධි පාඨමාලාව - 4 වන මට්ටම

අවසාන පරීක්ෂණය - 2006/2007

අපරාධ නීතිය - **LWU 2312**

කාලය - පැය තුනයි.

---

දිනය - 2007.03.08 වේලාව - පෙ.ව.10.00 - ප.ව.01.00 දක්වා

---

*අපැහැදිලි අත් අකුරුවලට ලකුණු අඩු කරනු ලැබේ.*
*<u>ප්‍රශ්න පහකට</u> පමණක් පිළිතුරු සපයන්න.*

01. "නීතියට අනුව, යමෙකු තමාගේ ස්වේච්ඡා සහගත ක්‍රියාවේ ප්‍රතිඵල චේතනා කර ඇති බව සලකනුයේ එම ක්‍රියාව සිදුවීමට ඉඩ ඇති බව පූර්වාපේක්ෂණය කළ ද නොකළ ද එකී ක්‍රියාව සිදුවීම අපේක්ෂා කරයි නම් හෝ නැතහොත් එම ක්‍රියාව සිදුවීම අපේක්ෂා කළත් නොකළත් එය සිදුවිය හැකි බවට පූර්වාපේක්ෂණය කරන විට දී ය."

    සදෝෂී මානසික ධාතුව නැමැති සංකල්පයේ මූලිකාංග ඉහත ප්‍රකාශය සහ විනිශ්චිත නඩු තීරණ ඇසුරින් සාකච්ඡා කරන්න.

02. "සාපරාධී වගකීම උද්ගත වීම පිණිස, මරණයට පත් වූ තැනැත්තාට පීඩාව සිදු වූ ක්‍රියාව සහ ඔහුගේ මරණය යන සිද්ධි දෙක අතර සංසාධන මාලාවේ ඍජු බැඳීමක් තිබිය යුතුය."

    නඩු තීරණ ඇසුරින් මෙම ප්‍රකාශය විවේචනාත්මකව විශ්ලේෂණය කරන්න.

03. වීර් සාරා සමග ඉතා සමීප මිත්‍ර සබඳතාවක් පැවැත් වී අතර වසර දෙකක පමණ කාලයක් තිස්සේ ඔවුහු එක්ව ගමන් බිමන් ගියහ. වීර්, නැගී එන නිළියක වූ කරිෂ්මා සමඟ සම්බන්ධයක් ඇරඹීමෙන් අනතුරුව ඔවුන්ගේ මිත්‍ර සම්බන්ධය අවසන් විය.

    දිනක් සාදයක දී සාරා ට වීර් සහ කරිෂ්මා මුණ ගැසුණ අතර එහිදී වීර් සහ සාරා අතර උණුසුම් වචන හුවමාරුවක් ඇති විය. අසභ්‍ය වචනයෙන් බැන ගැනීම් රැසකින් පසුව වීර් ට එතැනින් පිටවී යන ලෙස සාරා කීවා ය. වීර් පිටවීමට ප්‍රතික්ෂේප කළ විට සාරා ෂැම්පේන් වීදුරුවක් ඔහුගේ ඇඟට වත් කළා ය. වීර් සාරා ව බිත්තියකට හිර කර අල්ලාගෙන ඇගේ මුහුණට පහර දුනි. සාරා ෂැම්පේන් වීදුරුව අතෙහි රඳවාගෙන ම වීර් ට පහර දීමට ඉදිරියට පැන්නා ය. වීර්ගේ මුහුණේ වැදුන වීදුරුව බිඳී එහි ප්‍රතිඵලයක් ලෙස ඔහු ගේ දෙ ඇස්වලට බරපතල ලෙස හානි විය.

    තමා පෞද්ගලික ආරක්ෂාවේ අයිතිය භාවිත කරමින් කටයුතු කළ බව සාරා කියා සිටී.
    සාකච්ඡා කරන්න.

04. පෞරාණික භාණ්ඩ එකතු කරන්නකු වූ අමිත්, තම අසල්වැසියා වූ චානකට අයත් අතින් පින්තාරු කරන ලද කුඩා තැටියක් චානකගේ නිවසේ මේසයක් මත තිබෙනු දැක්කේ ය. සොයා දැනගත හැකි වේය යන බිය නිසා එවේලේම තැටිය ගැනීමට නිර්භීත නොවෙමින් අමිත්, චානකට කිසි විටකත් සොයා ගැනීමට බෙහෙවින් ම හැකි නොවනු ඇතැයි සිතිය හැකි ස්ථානයක තැටිය සැඟවූවේ ය. ඔහු විසින් එසේ කරනු ලැබුවේ නැතිවීම පිළිබඳව අමතක වූ විට තැටිය සඟවනු ලැබූ ස්ථානයෙන් එය ගැනීමේ චේතනාවෙනි.

සාකච්ඡා කරන්න.

05. සාවද්‍ය මනුෂ්‍ය ඝාතනය සහ, සාවද්‍ය මනුෂ්‍ය ඝාතනය මිනී මැරුමක් බවට පත් වන්නේ කුමන අවස්ථාවන් හි දී දැයි විනිශ්චිත නඩු තීරණ ඇසුරින් සාකච්ඡා කරන්න.

06. අවුරුදු 14 ක් වයසැති ජුලියට් නැමැති දැරිය ඇයගේ නීත්‍යනුකූල භාරකරුවන්ගෙන් අපහරණය කිරීම සම්බන්ධයෙන් රෝමියෝ ට චෝදනා කර ඇත. පහත සඳහන් විත්ති වාචකවල වැදගත්කම විනිශ්චිත නඩු තීරණ ඇසුරින් සලකා බලන්න.

(i) ජුලියට් රෝමියෝට ඇය සමග පැන යාමට එන ලෙස ආරාධනා කළ අතර ඒ සඳහා ඇය පාසැලට යන බව අඟවා ගෙදරින් පිට වී බස් නැවතුම් පලේ දී ඔහු ව මුණ ගැසුන බව.

(ii) රෝමියෝ ජුලියට් ට ආරාධනා කළේ සත්වෝද්‍යානයට යාමට පමණක් බවත් සැන්දෑවේ ඇය නැවත කැඳවාගෙන ඒම ඔහුගේ චේතනාව වූ බවත්.

(iii) තම වයස අවුරුදු 18 ක් බව ජුලියට් රොමියෝ ට අඟවා තිබූ බව.

07. මැදිවියේ විදේශිකයකු වූ අබ්දුල් ඛාන් නැමැත්තාට චපාති සෑදීම පිණිස ගන්නා බරැති තැටියකින් පහර දී හිස් කබල බිඳ මරා දැමූ බවට තරුණ සංචාරක මඟ පෙන්වන්නකු වූ සෙල්වන් ට චෝදනා නැගී ඇත. මරා දැමීම සිදු වූ අවස්ථාවේ අබ්දුල් ඛාන් සහ සෙල්වන් යන දෙදෙනා පමණක් අබ්දුල් ඛාන් ගේ තට්ටු නිවාසයේ සිට ඇත. සෙල්වන් විසින් පොලීසියට පවසන ලද්දේ එහිදී ඔහුගේ විරෝධය නොතකා අබ්දුල් ඛාන් විසින් සෙල්වන් ට ලිංගික අපයෝජනයක් සිදුකර අනතුරුව ඔහු වෙත උපහාසාත්මකව සිනාසුන බවයි. මේ අවස්ථාවේ සෙල්වන් ගේ ආත්මදමනය නැතිව ගොස් අබ්දුල් ඛාන් ට චපාති තැටියෙන් මාරාන්තික ලෙස පහර දී තිබේ.

සෙල්වන්ගේ සාපරාධී වගකීම සාකච්ඡා කරන්න.

08. පහත සඳහන් දෑ අතුරෙන් ඕනෑම දෙකක් පිළිබඳව සටහන් ලියන්න.

(i) උමතු බව පිළිබඳ විත්ති වාචකය.
(ii) සාපරාධී විශ්වාසය කඩ කිරීම නැමැති වරද.
(iii) පාපෝච්චාරණ සහ ඒවායේ ආවේශ්‍ය භාවය.
(iv) කැමැත්ත පිළිබඳ විත්ති වාචකය

- හිමිකම් ඇවිරිණි. -